Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

## අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු ගණන | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල සහායක | 01 | රා. පරි. ච. 03/2016 අනුව PL-1 2016 රු. 24,250- 10 x 250- 10 x 270 - 10 x 300 -12 x 330 - 36,410 (රා. පරි. ච. 3/2016 උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ.) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (විෂයයන් 06) කින් සාමාර්ථය ලබා තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |
| 02 | මුරකරු | 01 | රා. පරි. ච. 03/2016 අනුව PL-1 2016 රු. 24,250- 10 x 250- 10 x 270 - 10 x 300 -12 x 330 - 36,410 (රා. පරි. ච. 3/2016 උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. |
| 03 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | රා. පරි. ච. 03/2016 අනුව PL-1 2016 රු. 24,250- 10 x 250- 10 x 270 - 10 x 300 -12 x 330 - 36,410 (රා. පරි. ච. 3/2016 උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ.) | i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.<br>ii. ඉහත අංක i යටතේ සඳහන් කර ඇති අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ප්‍රමාණවත් පරිදි ඉදිරිපත් වී නොමැති අවස්ථාවලදී පමණක් 5 ශ්‍රේණිය සමත් අයදුම්කරුවන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

02. *බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු සුදුසුකම් හා කොන්දේසි :*

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරු අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදංචි අයෙකු විය යුතුය.

iii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.

(දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

iv. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමකින් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාත්වයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

v. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් නොලැබූවෙකු විය යුතුය.

vi. බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සඳහන් සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

vii. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී මෙම බඳවා ගැනීමේ ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අඹන්ගග කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පවතින පුරප්පාඩුවලට පත්කරනු ලැබේ.

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය 100* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ. උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරාගනු ලැබේ. |
| පළපුරුද්ද | 55 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණු වල එකතුව | 100 | |

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය, තේරී පත්වන අයදුම්කරුවන් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

ii. පත්වීමේ දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත්වන අතර, එම කාලය තුලදී වැඩ, පැමිණීම හා හැසිරීම, සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ ස්ථිර කරනු ලැබේ.

iii. රා. පරි. ච. ලේ. අංක 01/2014 අනුව පත්වීමේ දින සිට වසර 05 ක් ඇතුලත සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අමතරව අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම ලබා ගත යුතුය.

05. අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතික
(iii) ජාතික හැඳුනුම්පතේ පිටපත
(iv) මෑතකදී ලබාගත් ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද පදිංචි සහතිකය
(v) අධ්‍යාපන සහතිකවල පිටපත්
(vi) වෙනත් සුදුසුකම් දක්වෙන සහතිකවල පිටපත්
(vii) පළපුරුද්ද දක්වෙන සහතිකවල පිටපත්

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර ''ලේකම්, අඹන්ගග කෝරළේ ප්‍රාදේශීය සභාව, ගුරුබැබිල, මැටිහක්ක'' යන ලිපිනයට 2019.02.15 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ තමන් ඉල්ලුම් කරන තනතුර සඳහන් කර එවිය යුතුය.

සැලකිය යුතුයි:- අඩුපාඩු සහිතව ඉදිරිපත්වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කේ. ජී. චන්ද්‍රසිරි,
ලේකම්,
අඹන්ගග කෝරළේ ප්‍රාදේශීය සභාව.

2019 ජනවාරි 08 වන දින,
අඹන්ගග කෝරළේ ප්‍රාදේශීය සභාව,
ගුරුබැබිල මැටිහක්ක.

**අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව**

***ආදර්ශ අයදුම් පත්‍රය***

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ...................................... තනතුර සඳහා අයදුම්පත (අයදුම්කරන තනතුර සඳහන් කරන්න)*

01. (i) මුලකුරු සමග නම :——————————

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————

02. (i) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:——————————

03. ස්ථිර ලිපිනය:——————————

04. ජාතික හැඳුනුම්පත් අංකය:——————————

05. ස්ත්‍රී/පුරුෂ භාවය.:——————————

06. උපන් දිනය අවුරුද්ද:—————— මාසය:—————— දිනය:——————

07. 2019.02.15 දිනට වයස අවුරුදු :—————— මාස:—————— දින:——————

08. විවාහක/අවිවාහක බව:——————————

09. අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :——————————

10. ජාතිත්වය:——————————

11. ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද? එසේනම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————

12. අධ්‍යාපන සුදුසුකම් :——————————

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

13. i. වෙනත් සුදුසුකම්:——————————

ii. වෘත්තීය සුදුසුකම්:——————————

iii. සේවා පළපුරුද්ද :——————————

14. ඔබ දැනටමත් අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික) ආදී වශයෙන් :—————————— ..

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දන්නෙමි.

——————————

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන.................................................................. මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .......................................................................වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරාගත හොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහතික කර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

——————————,

දෙපර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————

පදවි නාමය :——————————

දෙපාර්තමේන්තුව/ආයතනය :——————————

(නිල මුද්‍රාව තබන්න)

දිනය :——————————